# හෙයියන්තුඩුව පුරාණ රජමහා විහාරයේ පැරණි සිතුවම්

ඩබ්ලිව්.එම්.ඩී. නිශාදි[32]

ඓතිහාසික වටිනාකමින් යුක්ත හායන කාරකයන්ට ලක් වී විනාශමුඛයට ඇදෙමින් යන්නා වූ විහාරස්ථාන රාශියක් ලංකාවේ දක ගන්නට ලැබේ. ඒ අතර ඓතිහාසිකමය වශයෙන් අඩු අවධානයක් යොමු වූ ස්ථානයක් වශයෙන් හෙයියන්තුඩුව පුරාණ විහාරය හඳුනා ගන්නට පුළුවන. බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හෙයියන්තුඩුව පුරාණ විහාරස්ථානය පිහිටා ඇත. හෙයියන්තුඩුව බටහිර ග්‍රාමසේවා වසමට අයත් වන මෙම විහාරය හෙයියන්තුඩුව ග්‍රාමයට අයත් ය. හෙයියන්තුඩුව විහාරයේ ඉතිහාසය සබැඳෙන්නේ දෙවැනි රාජසිංහ රජු සමඟ ය. විසි දහසක හමුදාවක් සමඟ රජතුමා මාබිම ගනේගල්ලේ කඳවුරු බැඳගත් අතර හේවායන් සඳහා උදෑසන කිරි ලබා ගැනීම උදෙසා ගවයන් හාර දහසක් පමණ ගෙනැවිත් ඇති අතර එම ගවයන් බැඳ තිබූ ස්ථානය තුඩුවක ස්වරූපය ගෙන ඇත. මෙම හෙයියන් ගාල් කළ තුඩුව " **හෙයියන්තුඩුව"** සේ හඳුන්වා ඇත. මහනුවර යුගයේ අවසාන කාලයට හෙයියන්තුඩුව විහාරයේ සිතුවම් අයත් වේ. විහාර බිත්තියේ පිට පැත්තේ සිතුවම් රහිත ය. ඇතුළු පැති බිත්තිවල තීරු වශයෙන් වෙන්කර අඳින ලද සිතුවම් සහිත ය. පහළ ම තීරුවේ දෑගැබ් සිතුවම් , දේවරූප සිතුවම්, මෛත්‍රී බෝසත්, රාම, විභීෂණ සේ ම භික්ෂූන් වහන්සේ කෙනෙකුගෙන් යුත් සිතුවමකි. පළමවැනි තීරුවේ රහතුන් අතදරා සිටින්නේ නෙළුම් මල් ය. දෙ වැනි හා තෙ වැනි තීරු කඩුපුල් මල් අතින් දරා සිටින රහත් රූප හා පසුබිම මල් මෝස්තරයන්ගෙන් බිත්ති සම්පූර්ණ කර ඇත. පසුබිම් වර්ණය රතු ය. ධ්‍යාන මුද්‍රාවෙන් යුක්ත සමාධි බුදු පිළිමයක් දක්නට ලැබෙන අතර බුද්ධ ප්‍රතිමාව පිටුපස බිත්තියේ අර්ධයක පමණ ප්‍රමාණයක රැස්මාලාවක් ද ඉතිරිය සිතුවම් වලින් ද යුක්ත ය. පිළිමය දෙපස දෑගැබ් දෙනම සහ රහතන් වහන්සේලා නිරූපණය කර ඇත. පූර්ව සංරක්ෂණ ක්‍රියාදාමයකට ලක්කර තිබුණ ද මෙහි හායන තත්වයන් දිනෙන් දින වර්ධනය වන ආකාරයක් දක්නට ලැබේ. හෙයියන්තුඩුව විහාරයේ සිතුවම් අධ්‍යයනයේ දී මානව ක්‍රියාකාරකම්, ස්වාභාවික හානි සේම කෘමි හානි යනාදි පැවැත්මට හානිකර වූ තත්ත්වයන් රාශියක් හඳුනා ගැනීමට හැකිවිය. එසේ ම බදාම ස්තරවල සංඝටක අංශු අතර ශක්තිය දුර්වල වීම නිසාවෙන් ඇති වූ හායනයන් ද දක්නට ලැබේ. පැරණි බිතුසිතුවම් හීන වී යන අවධියක මෙ වැනි විහාරයක් ආරක්ෂා වී තිබීම ද වැදගත් ය. පූර්ව සංරක්ෂණ ක්‍රියාදාමයකට නතු වූ මෙම විහාරය පිළිබඳ ව තවදුරටත් පුරාවිද්‍යා නිළධාරීන්ගේ අවධානය යොමු කරමින් නිසි වූ නඩත්තු ක්‍රියා පිළිවෙතක් අනුගමනය කිරීම ඔස්සේ මෙම සිතුවම් තවදුරටත් ආරක්ෂා කර ගැනීමට හැකියාව ලැබේ. මානව ක්‍රියා ඒ අතර ප්‍රධානත්වයක් ගත්ත ද කළ යුතු රසායනික ප්‍රතිකර්ම ද බහුල ය. එය වළක්වමින් චිත්‍ර ආරක්ෂා කිරීමට නම් සංරක්ෂණය කරන ලද මෙම විහාරයට අවශ්‍යය වන්නේ නිසි නඩත්තුව ය.

ප්‍රමුඛ පද: හෙයියන්තුඩුව, සිතුවම්, සංරක්ෂණ

---

[32] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.